සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
පස්වැනි කලාපය, ප්‍රථම භාගය, 2010 ජනවාරි , 53-74
ISSN 1800-1459

# ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්: කොළඹ මැගසින් කාන්තා බන්ධනාගාරය ඇසුරින් කරන ලද අධ්‍යයනයක්

**එච්. රංජිත්[1] සහ රවින්ද්‍ර චන්ද්‍රසිරි පල්ලියගුරුගේ[1]**

[1]සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. අංක 02, බෙලිහුල්ඔය.

**සාරාංශය**

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් බන්ධනාගාර ආශ්‍රිත ව සුරක්ෂිත නොවන්නේ ඇයි ද යන්න කොළඹ මැගසින් කාන්තා බන්ධනාගාරය ඇසුරින් විමසා බැලීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වේ. සිය මව්වරු සමඟ බන්ධනාගාරවල ජීවත්වන ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීම පිළිබඳ ව විමසීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මව යම් වරදක් කර චෝදනා හෝ දඬුවම් ලබා බන්ධනාගාරගත කරන විට ඇය සමඟ සිටින අවුරුදු එකත් පහත් අතර වයසේ පසු වන දරුවෝ ද සිය මව සමඟ බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂිත ළමයාගේ උපරිම යහපත ඉටු වේ ද යන්න පර්යේෂණයට ලක් කිරීම මෙහි දෙවන අරමුණ වේ. ළමයාගේ උපරිම යහපත සලකාගෙන සිය මව සමඟ වුවත් ළමයෙකු බන්ධනාගාරගත කිරීම මගින් බන්ධනාගාර ආශ්‍රිත ව ගොඩනැගී ඇති උපසංස්කෘතිය සහ නෛතික ක්‍රියා පටිපාටීන් හේතු කොටගෙන එම ළමයාගේ අයිතිවාසිකම් උල්ලංඝණය වන බව උපන්‍යාසයක් වශයෙන් යොදා ගෙන ඇත. පර්යේෂණ ක්‍රමවේදය ගුණාත්මක පර්යේෂණ ක්‍රමයන් මත පදනම් වී ඇත. පර්යේෂණයේ දී ප්‍රාථමික මෙන් ම ද්වීතීක දත්ත යොදා ගනු ලැබී ය. ළමයාගේ උපරිම යහපත සලකාගෙන සිය මව සමඟ වුවත් ළමයෙක් බන්ධනාගාරගත කළ විට බන්ධනාගාරය තුළ ගොඩ නැගී ඇති උපසංස්කෘතිය සහ බන්ධනාගාර කාර්ය පටිපාටීන් හේතු කොටගෙන එම ළමයාගේ අයිතිවාසිකම් උල්ලංඝණය වන බව පර්යේෂණ ප්‍රතිඵල මගින් සනාථ විය. තම මව විසින් කරන ලද වරදට මව සමඟ සිර ගත වීම මඟින් ළමයා සතු නිදහසේ ජීවත් වීමේ අයිතිය අහිමි වන බව පර්යේෂණයේ පළමු සොයා ගැනීම වේ. එමෙන් ම ළමයාගේ පෝෂණයට ඇති අයිතිය බන්ධනාගාරයේ දී නිසි පරිදි ඉටු නොවන බව දෙවන සොයා ගැනීම වේ. බන්ධනාගාරය තුළ ගොඩ නැගී ඇති උපසංස්කෘතිය සහ බන්ධනාගාර කාර්ය පටිපාටීන් හේතු කොටගෙන ළමයාගේ මානසික සහ පෞරුෂ වර්ධනයට අහිතකර බලපෑම් ඇති බව තෙවන සොයා ගැනීම වේ. මව්වරු සමඟ සිරගත කිරීම මගින් ළමුන්ගේ උපරිම යහපත අපේක්ෂා කළ ද බන්ධනාගාරය තුළ දී ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ වන බව මේ අනුව නිගමනය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචන** : සිරගතවීම, මව්වරු, ළමයි, අයිතිවාසිකම්, බන්ධනාගාරය

## හැඳින්වීම

යම් පුද්ගලයෙකු සිරගත කිරීමෙන් අරමුණු දෙකක් අපේක්‍ෂා කෙරේ. පළමු අරමුණ කළ වරදට දඬුවමක් ලබා දීම ය. දෙවැනි අරමුණ එම තැනැත්තා පුනරුත්තාපනය කිරීම ය. එහෙත් එම අරමුණු දෙකෙන් ම පරිබාහිර අරමුණක් ඉටු කර ගැනීම පිණිස යම් පිරිසක් බන්ධනාගාරගත කිරීමක් ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. ඒ අය අතර ඉපදීමට අපේක්ෂාවෙන් පසු වන අය ද ඉපදී දින කිහිපයක් ගත වූවෝ ද වෙති. එනම් වරදක් තබා වරදක් යනු කුමක් යන්නවත් හරි හැටි නොදත් අවුරුදු එකත් පහත් අතර වයසේ පසු වන කුඩා ළමුන් ය. මව යම් වරදක් කර චෝදනා හෝ දඬුවම් ලබා

බන්ධනාගාරගත කරන විට අවුරුදු එකත් පහත් අතර වයසේ පසු වන ඇයගේ දරුවෝ ද සිය මව සමඟ සිටීම ඔවුන්ගේ උපරිම යහපතට හේතුවනු ඇත යන උපකල්පනය මත බන්ධනාගාරගත කරනු ලැබෙති. එලෙස බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂිත පරිදි ළමයාගේ උපරිම යහපත ඉටු වේ ද යන්න පර්යේෂණයට ලක් කිරීම මෙම අධ්‍යයනයේ මුඛ්‍ය අරමුණ වේ.

## අරමුණු

- සිය මව්වරු සමඟ බන්ධනාගාරවල ජීවත්වන ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීම පිළිබඳ ව විමසීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

- මව යම් වරදක් කර චෝදනා හෝ දඬුවම් ලබා බන්ධනාගාරගත කරන විට ඇය සමඟ සිටින අවුරුදු එකත් පහත් අතර වයසේ පසු වන දරුවෝ ද සිය මව සමඟ බන්ධනාගාරගත කිරීමෙන් අපේක්ෂිත ළමයාගේ උපරිම යහපත ඉටු වේ ද යන්න පර්යේෂණයට ලක් කිරීම මෙහි දෙවන අරමුණ වේ.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය ප්‍රමුඛ වශයෙන් ගුණාත්මක අධ්‍යයන ප්‍රවේශයක් මත ගොඩනැගී ඇත.

## අධ්‍යයන ගැටළු ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් බන්ධනාගාර ආශ්‍රිත ව සුරක්ෂිත නොවන්නේ ඇයි ද යන්න විමසා බැලීම මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටළුව වේ.

## උපන්‍යාසය

ළමයාගේ යහපත සලකාගෙන සිය මව සමඟ වුවත් ළමයෙකු බන්ධනාගාරගත කිරීම මගින් බන්ධනාගාර ආශ්‍රිත ව ගොඩනැගී ඇති උපසංස්කෘතිය සහ නෛතික ක්‍රියා පටිපාටීන් හේතු කොටගෙන එම ළමයාගේ අයිතිවාසිකම් උල්ලංඝණය වන බව උපන්‍යාසයක් වශයෙන් යොදා ගෙන ඇත.

## නියැදිය

ලංකාවේ ප්‍රධාන බන්ධනාගාර කිහිපයක් ඇතත් ලංකාවේ කාන්තා රැඳවියන් වෙනුවෙන් පිහිටුවන ලද ප්‍රථම සිර කඳවුර මැගසින් බන්ධනාගාරය වේ. කොළඹ නගරය තුළ පිහිටා ඇති මෙම බන්ධනාගාරයට දිවයිනේ සෑම ප්‍රදේශයකින් ම විවිධ අපරාධ සඳහා චෝදනා හෝ දඬුවම් ලැබුවන් දින පතා රැගෙන එනු ලබයි. එම නිසා අනෙක් බන්ධනාගාරයන්හි සිටින ළමුන් ප්‍රමාණයට වඩා වැඩි ළමුන් පිරිසක් මැගසින් බන්ධනාගාරයේ ජීවත් වන ආකාරය හඳුනා ගත හැකි ය. මෙම හේතු පදනම්

කරගෙන පර්යේෂණ නියැදිය මැගසින් බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් සමඟ සිටින ළමුන් පාදක කර ගෙන ගොඩ නගන ලදී. යොදාගෙන කොළඹ මැගසින් බන්ධනාගාරයේ කාන්තා අංශයේ මව්වරු සමඟ සිරගත වී සිටින ළමුන් තිස් දෙනෙකු සරල සසම්භාවී ක්‍රමයට තෝරා ගෙන ඒ ඇසුරින් පර්යේෂණ නියැදිය සකසා ගනු ලැබී ය.

## දත්ත රැස් කිරීම

පර්යේෂණයේ දී ප්‍රාථමික මෙන් ම ද්විතීක දත්ත යොදා ගනු ලැබී ය. ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනු ලැබී ය. එමෙන් ම නිරීක්ෂණ අධ්‍යයන ක්‍රමය ද ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා යොදා ගනු ලැබී ය. ද්විතීක දත්ත ලබා ගැනීම සඳහා පොත්, පුවත්පත්, වාර සඟරා, පර්යේෂණ ග්‍රන්ථ සහ අන්තර්ජාලය පරිශීලනය කරන ලදි.

## නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්හි දක්නට ලැබුණු වර්ධනය

නිදහසට පසු යුගයන්හි දී ළමයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනයට අවශ්‍ය කරන පියවර ගැනීමට පාලක පන්තිය කටයුතු කර ඇත. විශේෂයෙන් ම 1956 දී සම්මත කළ කාන්තාවන්, තරුණයින් සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත මගින් අතීතයේ සිට පැවති ළමා සුභසාධන කටයුතු එලෙසින් ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සලසා තිබුණි. නමුත් මෙම පනත මගින් දුර්වලතා කිහිපයක් ද හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම ළමුන් විධිමත් හා නොවිධිමත් ක්ෂේත්‍රය තුළ සේවයේ යෙදවීම තහනම් කරන විධිවිධාන අඩංගු නොවී ය. එසේම අනිවාර්ය අධ්‍යාපනය සඳහා නීති ක්‍රියාත්මක නොවන නිසා පාසැල් කාලය තුළ වයස අවුරුදු 12 ට අඩු ළමුන් සේවයේ යෙදවීම වළක්වා ගත නොහැකි විය. කෙසේ වුව ද රාත්‍රී මුර සේවය උදෙසා, විනෝද කටයුතු සඳහා, අනතුරුදායක කාර්යයන් සඳහා ළමුන් යොදා ගැනීම මෙම පනතින් තහනම් කර ඇත.

1970 සුජාත කිරීමේ පනතට අනුව විවාහයෙන් බාහිර ව උපත ලබා ඇති ළමුන්ගේ මාපියන් පසුව විවාහ වීමෙන් එම දරුවන්ට සුජාතභාවය ලැබීමේ අයිතිය තහවුරු කර ඇත. මෙ මඟින් ජාතිය, ආගම, හා භාෂා අනන්‍යතාව ආදී අයිතීන් සුරක්ෂිතවීමක් ලෙස පෙන්වාදිය හැකි ය.

1972 නඩත්තු සංශෝධන පනතෙන් බාලවයස්කරුවන්ට තම නඩත්තුව සඳහා තම මව්පියන්ගෙන් වඩාත් යුක්තිසහගත මුදලක් ලබාගත හැකි වන ආකාරයේ විධිවිධාන සලසා දී තිබුණි. මෙමඟින් අපේක්ෂා කර ඇත්තේ ළමුන්ට ඉදිරියේ දී ඉතා ඉහළ සමාජ ජීවිතයක් ගතකිරීමට අවශ්‍ය කරන පසුබිම සලසා දීම ය.

ලංකාවේ ළමා අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම උදෙසා හා එය වර්ධනය කිරීම උදෙසා මෙරට අධිකරණ පද්ධතිය විශාල සේවයක් සිදු කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම ළමුන්ගේ භාරකාරත්වය සහ නඩත්තු කටයුතු යන අංශවල දී මෙය වඩාත්ම සුවිශේෂී ලෙස ඉස්මතු වී ඇති අයුරු පැහැදිලි ය. ළමයාගේ භාරකාරත්වය සම්බන්ධයෙන් පියාට ඇති වරණීය අයිතිය නීති මඟින් පිළිගතු ලැබුව ද ළමයාගේ යහපත උදෙසා එම භාරකාත්වය පියාගෙන් ඉවත් කිරීමට අධිකරණයට ඇති හැකියාව 1961 වේරගොඩ එදිරි ව වේරගොඩ නඩු තීන්දුව මඟින් පෙන්නුම් කර ඇත (රත්නායක, 1998: 9). ළමයාගේ භාරකාරත්වය පැවරීමේ දී අභිමත වයසේ සිටින ළමුන්ගෙන් අදහස් විමසා සිටීමේ අයිතිය අධිකරණය මඟින් ලබා දී තිබුණි. 1955 එවලින් වර්ණකුලසූරිය නඩුවේ දී 15 හැවිරිදි ළමයෙකුගේ කැමැත්ත පරිදි තෙවැනි භාරකරුවෙකුට ළමයා භාරදීමට අධිකරණය ක්‍රියා කර ඇත. එමඟින් අපේක්‍ෂා කර ඇත්තේ ඉතා ඉහළ ජීවන තත්ත්වයකට ළමයාගේ ජීවිතය නගා සිටුවීමට අවශ්‍ය වටපිටාව සැකසීම ය. මෙහි දී ළමයාගේ උපරිම යහපත සැලසීමේ සංකල්පය ක්‍රියාත්මක වී ඇති අයුරු ද හඳුනාගත හැකි ය.

නිදහසින් පසු මෙරට ළමා අයිතිවාසිකම් සම්බන්ධ ව විධිවිධාන ඇතුළු ව මානව අයිතිවාසිකම් ක්ෂෙත්‍රය පුළුල් වෙනසකට පත්වන ආකාරය 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව සම්මත වීමත් සමඟ ම හඳුනාගත හැකි ය. ලංකාවේ දී ප්‍රථම වරට අයිතිවාසිකම් ප්‍රකාශනයක් ව්‍යවස්ථාව මඟින් දැක්වීම හා එය කඩවීමේ දී ගතයුතු පියවර 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මඟින් දක්වා තිබුණ (දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978: 610). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය පුද්ගලයින් සහ පුරවැසියන් කෙරෙහි බලපාන බව දැක්වීම නිසා ළමුන්ට අදාළ වන බව පැහැදිලි ය.

1989 දී සම්මත කළ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය නැතිනම් ප්‍රඥප්තිය පිළිගෙන ක්‍රියාත්මක කිරීමට බැඳී ඇති පාර්ශව රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැකි ය (ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1989:139). එසේම ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය පිළිගෙන එය ක්‍රියාත්මක කිරීමට ගිවිස ගෙන තිබේ. විශේෂයෙන් ම 1991 දී ළමුන් සඳහා වන ක්‍රියාකාරී ජගත් සැලැස්මකට ශ්‍රී ලංකාව අත්සන් තැබීම මඟින් ළමුන්ගේ අයිතිවාසිකම් කෙරෙහි ශ්‍රී ලංකාවේ ස්ථාවරය පිළිබිඹු වන්නට විය. එසේම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අනුකූල ව කටයුතු කරමින් ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා ක්‍රියාකාරී ජාතික සැලැස්මක් පිළියෙල කරමින් විෂයෙහි වර්ධනය කරගත යුතු අවස්ථා හඳුනාගෙන ඇත.

1992 දී ළමුන් පිළිබඳ ප්‍රඥප්තිය පිහිටුවන ලදී. මේ මගින් ළමා අයිතිවාසිකම් සම්බන්ධ ව අඛණ්ඩ නිරීක්‍ෂණයේ යෙදීම සඳහා කමිටුවක් පත්කර තිබුණි. එම කමිටුව ජනාධිපතිගේ නාමකරණයෙන් 06 දෙනෙකු ද අධ්‍යාපන, අධිකරණ, ආරක්‍ෂක, සෞඛ්‍ය,

වනිතා කටයුතු, සමාජ සේවා සැලසුම් සහ පළාත් සභා යන අමාත්‍යංශවල ලේකම්වරුන්ගෙන් ද පරිවාස හා ළමා ආරක්ෂණ කොමසාරිස් යන නිළධාරීන්ගෙන් ද සමන්විත විය. ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කිරීම, ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ කරුණු සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීම, එම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාවට නැංවීම හා නිරීක්ෂණය කිරීම යනාදිය මෙම කමිටුවට අයත් ප්‍රධාන කාර්යයන් විය.

පසුව මෙම කමිටුව කමිටු 5ක් දක්වා වර්ධනය වී ඇත. එනම්

1. ජාතික කමිටුව
2. පළාත් මෙහෙයුම් කමිටුව
3. දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව
4. ප්‍රාදේශිය මෙහෙයුම් කමිටුව
5. ග්‍රාමීය මෙහෙයුම් කමිටුව

පහළ මට්ටමේ ඇති කමිටු අධීක්ෂණය ජාතික කමිටුවේ ප්‍රධාන ම වගකීමකි. 1991 සිට 1995 දක්වා කාලය තුළ ජාතික කමිටුව විසින් ළමයින් සඳහා පස් අවුරුදු ජාතික සැලැස්මක් සකස්කර ක්‍රියාවට නංවන ලදී.

දෙවන කමිටුව පළාත් මෙහෙයුම් කමිටුව වේ. එහි සංයුතිය රුක් සටහන් 1 හි පරිදි හඳුනාගත හැකි ය .

**පළාත් මෙහෙයුම් කමිටුව**

**සභාපති**
පළාත් සභාවේ ප්‍රධාන ලේකම්

**ලේකම්**
පරිවාස හා ළමා ආරක්ෂක සේවා කොමසාරිස්

**සමාජිකයෝ**
1. පරිවාස හා විෂයභාර අමාත්‍ය
2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක
3. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක
4. පළාත් භාර නියෝජ්‍ය පොලිස්පති
5. පළාත් නියෝජ්‍ය ලේකම්
6. ස්වේච්ඡා සංවිධාන නිළධාරීන් තිදෙනා

රුක් සටහන 1: පළාත් මෙහෙයුම් කමිටුවේ සංයුතිය

මෙම කමිටුවේ ප්‍රධාන වගකීම් ලෙස ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ විධිවිධාන සම්බන්ධ ව අවබෝධයක් ජනතාව කෙරෙහි ඇති කිරිම, ප්‍රඥප්තියේ ඇති කරුණු සම්බන්ධ ව නීති සම්පාදනය කරන විට තම යෝජනා ඉදිරිපත් කිරිම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරිම යනාදිය පෙන්වාදිය හැකි ය. මෙම කමිටුවට පහළින් දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව ඇත. එහි සභාපති ලෙස දිස්ත්‍රික් මහ ලේකම් කටයුතු කරයි. සෞඛ්‍ය, පොලිස්, පරිවාස ආදි ආයතනවල ඉහළ නිළධාරින් සහ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් කිහිපදෙනෙක් සෙසු සමාජිකයෝ වෙති.

දිස්ත්‍රික් කමිටුවට පහළින් ප්‍රාදේශිය මෙහෙයුම් කමිටු ඇත. මෙම කමිටුව ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරිම සඳහා ප්‍රාදේශිය නිළධාරින් සහ ප්‍රජාව සම්බන්ධකරගෙන ගොඩනැගී ඇත. ප්‍රාදේශිය මෙහෙයුම් කමිටුවේ සංයුතිය රූක් සටහන් 2 හි දක්වා ඇති පරිදි වේ .

**ප්‍රාදේශිය මෙහෙයුම් කමිටු**


| **සභාපති** | **ලේකම්** | **සමාජිකයෝ** |
|---|---|---|
| ප්‍රාදේශිය ලේකම් | අධිකරණ කළාපය භාර පරිවාස නිළධාරියා | 1. කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂක<br>2.සහකාර සැලසුම් අධ්‍යක්ෂක<br>3. ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක<br>4. පොලිස් ස්ථානාධිපති<br>5. එම කොට්ඨාශයේ සියලුම ග්‍රාම නිළධාරීන්<br>6. රාජ්‍ය නොවන සංවිධාන වල (ළමා සංවර්ධනයට අදාල) නියෝජිතයන් තිදෙනා |

(බණ්ඩාර, 2002: 88)

**රූක් සටහන 2: ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවේ සංයුතිය**

ජාතික, පළාත් සහ දිස්ත්‍රික් කමිටුවල ඇති කාර්යයන්වල යම්යම් කොටස් සමඟින් ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුවට තවත් සුවිශේෂ කාර්යයන් ඇත. එනම් ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට සහ ග්‍රාමීය මෙහෙයුම් කමිටු පත්කිරීම සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ළමා සුභසාධනයට සහ ආරක්ෂාවට අදාළ සැලසුම් අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීම ආදිය වේ.

ප්‍රාදේශීය මෙහෙයුම් කමිටු මඟින් ග්‍රාමීය මෙහෙයුම් කමිටු ස්ථාපිත කිරීමට අවශ්‍ය වටාපිටාව සකසයි. ග්‍රාමීය මෙහෙයුම් කමිටු මගින් අපේක්ෂා කරන ප්‍රධාන කාර්යයන් කිහිපයක් හඳුනා ගත හැකි ය. ළමයින්ගේ ගැටළු ග්‍රාමීය මට්ටමේ දී හඳුනාගැනීමට දායක වීම සහ ඒවා විශ්ලේෂණය කිරීම, ළමුන්ගේ තත්ත්වය සම්බන්ධ ව ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම, බාහිර වශයෙන් බලපාන ගැටළු ඉහළ කමිටුවලට යොමු කිරීම, ළමා සංවර්ධනයට අවශ්‍ය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදිය ග්‍රාමීය මෙහෙයුම් කමිටුවට පැවරුණු ප්‍රමුඛ කාර්යයන් වේ. ග්‍රාමීය මෙහෙයුම් කමිටුවේ සංයුතිය රුක් සටහන 3 හි පරිදි දැක්විය හැකි ය.




(බණ්ඩාර 2002: 89)

**රුක් සටහන 3: ග්‍රාමීය මෙහෙයුම් කමිටුවේ සංයුතිය**

1994 න් පසුව ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා විශේෂ විධිවිධාන ශ්‍රී ලංකා රජය ගෙන ඇති ආකාරය හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම 1995 අංක 22 දරන පණතින්, දණ්ඩනීති සංග්‍රහයට කළ සංශෝධන මඟින් නව නීති කිහිපයක් හඳුන්වා දෙන ලදී (දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධිත) පණත 1995:1). දණ්ඩ නීති සංග්‍රහයට

බලපාන වෙනත් නීති ද මෙමගින් වෙනස් විය. එසේම 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂණ අධිකාරී පණත පාර්ලිමේන්තුවේ දී සම්මත වීම නිසා 1999 සිය ජාතික ළමා ආරක්ෂණ අධිකාරීය පිහිටුවනු ලැබී ය (ජාතික ළමා ආරක්ෂණ (අධිකාරිය) පණත 1998:1). 1996 දී ළමා අපයෝජන පිළිබඳ ජනාධිපති කාර්යසාධක බලකාය පත් කිරීම ළමා අපයෝජන වැළැක්වීම පිණිස ගත් ප්‍රගතිශීලී පියවරක් ලෙස හැඳින්විය හැකි ය.


1995 අංක 22 දරන පණතට අනුව දණ්ඩනීති සංග්‍රහයේ 308 (අ) වගන්තිය කෙරෙන් ; ළමයාට අකාරුණික ලෙස සැලකීම, නොතකා හැරීම, බිය ගැන්වීම, තර්ජනය කිරීම, ළමයාගේ ශාරීරික හෝ මානසික සෞඛ්‍යයට හානි සිදුවිය හැකි ආකාරයේ වද හිංසා කිරීම, නින්දා අපහාස කිරීම, අතරමං කිරීම යනාදිය ළමා හිංසයන් ලෙස දක්වා ඇත (දණ්ඩ නීති සංග්‍රහය(සංශෝධිත)පණත 1995:3). කෙසේ වෙතත් ඉහත වරදකට චෝදනාවකට ලක්වූවෙක් මහාධිකරණයෙන් අසන ලද නඩුවෙන් වරදකරු වූ විට අවුරුදු 2ට නොඅඩු අවුරුදු අවුරුදු 10ට නොවැඩි සිර දඬුවමක් විඳිය යුතු අතර ළමයාට වන්දියක් ද ගෙවිය යුතු ය (එම 1995:3).

දණ්ඩනීති සංග්‍රහයේ 286 (අ)(1) වගන්තිය කෙරෙන් ළමා ලිංගික අතවර විස්තර කර දඬුවම් කාලය පිළිබඳ ව ද සඳහන් කර ඇත. අසභ්‍ය දර්ශනයක, ප්‍රදර්ශනයක, ඡායාරූපයක, චිත්‍රපටයක පෙනීසිටීමට ළමයාට බලකිරීම, පෙළඹවීම වරදක් වන බව එහි දක්වා ඇත (එම 1995:2). දණ්ඩනීති සංග්‍රහයේ 360 (අ) වගන්තිය මගින් ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම සම්බන්ධ ව ඇති නීතිමය විධිවිධානයන් දක්වා ඇත (එම 1995:6). ළමයින්ට එරෙහි දැඩි අශිෂ්ට ක්‍රියා, ලිංගික අතවර, බරපතළ ලිංගික අතවර ආදිය මෙයට ඇතුළත් වේ. දැඩි අශිෂ්ට ක්‍රියා යන්නෙන් සමලිංගික සේවනය අදහස් වනුවා විය හැකි ය. මෙවැනි චෝදනාවන්ට ලක්වූවෙකුට අවුරුදු 5 ට නොඅඩු 20ට නොවැඩි සිරදඬුවම් ලැබීමට සහ වන්දියක් ගෙවීමට සිදුවේ (එම 1995:7). දණ්ඩ නීති සංග්‍රහයේ 363 වගන්තිය මගින් ව්‍යභිචාරය ඇතුළු ස්ත්‍රී දූෂණයන් පිළිබඳ ව විග්‍රහ කර ඇත. එම වගන්තියට අනුව වයස අවුරුදු 16ට අඩු ස්ත්‍රියකගේ කැමැත්ත ඇති ව හෝ නැති ව සංසර්ගයේ යෙදීම ස්ත්‍රී දූෂණයකි. ව්‍යභිචාරය ඇතුළුව ස්ත්‍රී දූෂණ චෝදනා ලැබුවෙකු අවම අවුරුදු 07 ක් සහ උපරිම අවුරුදු 20ක් සිරදඬුවමකට ලක් කළ හැකි ය. ව්‍යභිචාරයට තැත් කිරීම ද වරදක් ලෙස පිළිගැනෙන අතර ඒ සඳහා අවුරුදු දෙකක සිර දඬුවමක් ලබාදිය හැකි ය (එම 1995:9).

මේ අනුව ශ්‍රී ලංකාවේ ළමා අයිතීන් සුරක්ෂිත කිරීම උදෙසා විවිධ පියවරයන් ගෙන ඇති ආකාරය හඳුනාගත හැකි ය.


## කොළඹ මැගසින් බන්ධනාගාරය ආශ්‍රිත ව ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් බිඳ වැටීම

2009 වර්ෂය වන විට කාන්තා රැඳවියන් 640 ක් බන්ධනාගාරය තුළ රඳවා තිබේ. සිර දඬුවම් ලබා සිටින සංඛ්‍යාව 205 ක් වන අතර සැක පිට සිටින සංඛ්‍යාව 406 කි. දඬුවම් පිළිබඳ ව අභියාචනා ඉදිරිපත් කර තිබෙන 24 දෙනෙක් ද බන්ධනාගාරය තුළ ජීවත් වෙති. එම පිරිසෙන් ගැබිණි අවස්ථාවේ පසුවන රැඳවියන් සිව් දෙනෙක් ද දරුවන් සිටින රැඳවියන් 41ක් ලෙස ද හඳුනාගත හැකි විය. එම දරුවන් ද වයස් කාණ්ඩ කිහිපයක් යටතේ හඳුනාගත හැකි ය. ප්‍රස්තාරය 1 ඒ සඳහා යොදාගත හැකි ය.




**ප්‍රස්තාර සටහන 1: මව්වරු සමඟ බන්ධනාගාරගත දරුවන්ගේ වයස**
**(කොළඹ මැගසින් බන්ධනාගාරය ආශ්‍රිත ව කරන ලද නියැදි සමීක්ෂණය 2009)**

එම පිරිසෙන් 23% ක් පිරිමි දරුවන් වන අතර 21% ගැහැණු දරුවන් ය. ගර්භණී හෝ දරුවන් සිටින රැඳවියන්ගෙන් 77% ක් පමණ මත්ද්‍රව්‍ය වෙළඳාම් කිරීම, මත්ද්‍රව්‍ය ළඟ තබා ගැනීම යන චෝදනා මත හෝ එයට හිමි වූ දඬුවම් භුක්ති විඳින රැඳවියන් වශයෙන් සිරගත වී සිටිති. 23% ක් මුදල් වංචා, ගණිකා වෘත්තියේ නියැලීම සහ පහර දීම් යන චෝදනා මත හෝ එයට හිමි දඬුවම් හේතුකොටගෙන සිරගත වී සිටිති ප්‍රස්තාර සටහන 2.




**ප්‍රස්තාර සටහන 2: දරුවන් සමඟ බන්ධනාගාරගත මව්වරුන් සිදු කර ඇති වරදෙහි ස්වභාවය**

සිරගත වූ රැඳවියන්ගෙන් 82% ක් දෙවරකට වඩා සිරගත වී ඇති අතර 18% ක් පමණ රැඳවියන් ප්‍රථමවරට සිරගත වී ඇත. එක් වරකට වඩා සිරගත වී සිටින රැඳවියන් පළමුවර සිරගත වීමේ දී ද දරුවන් සමඟ සිරගත වී ඇත. එසේත් නැතිනම් එවිට ඔවුන් ගර්භණී අවස්ථාවේ පසු වී ඇත.

බන්ධනාගාරය තුළ මව්වරු සමඟ සිටින ළමුන්ගේ අයිතිවාසිකම් උපක්ෂේත්‍ර කිහිපයක් යටතේ විමසා බැලීමට කටයුතු කරන ලදී. විශේෂයෙන් ම ළමුන්ට අවශ්‍ය පෝෂණය, සෙනෙහස, ආරක්ෂාව, මානසික හා කායික සංවර්ධනය යන ක්ෂේත්‍ර යටතේ බන්ධනාගාරය තුළ සිටින ළමුන්ගේ අයිතිවාසිකම් සුරකෙන ආකාරය පර්යේෂණයට ලක් කරන ලදී.


## පෝෂණය හා සෞඛ්‍යයට ඇති අයිතිය

මව්වරු සමඟින් බන්ධනාගාරගත වී ඇති ළමුන්ගේ පෝෂණ අයිතිය නිසි අයුරින් ඉටු නොවන බව හඳුනාගත හැකි විය. විශේෂයෙන් අතිරේක පෝෂණ ආහාර ළමුන්ට නොලැබෙන බව බොහෝ රැඳවියන් විසින් ප්‍රකාශ කරන ලදි. විශේෂයෙන් ම ළමා පෝෂණ ආහාරයක් වශයෙන් ලබා දෙන ත්‍රිපෝෂ ප්‍රමාණවත් නොවන බව දැකිය හැකි ය. බන්ධනාගාර නිලධාරිහු ද මෙම තත්ත්වය පිළිගනිති. බන්ධනාගාරයට ලැබෙන ත්‍රිපෝෂ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා සති දෙකකට වරක් ත්‍රිපෝෂ ලබා දෙන බව බන්ධනාගාර නිලධාරිහු ප්‍රකාශ කරති. ත්‍රිපෝෂ ලබා දෙනු ලබන්නේ සර්වෝදය හා ඔවසිස් ජාත්‍යන්තර පාසල අනුග්‍රහයෙන් පවත්වාගෙන යනු ලබන පෙර පාසල මඟිනි. මෙම ත්‍රිපෝෂ ලබා දීමේ දී පෙර පාසලට පැමිණෙන දරුවන්ට ප්‍රමුඛ ස්ථානයක් හිමිවන ආකාරය හඳුනාගත හැකි ය. පෙර පාසල් යායුතු වයසේ සිටින එහෙත් පෙර පාසලට නොයන ළමුන් ද දැක ගත හැකි විය. ඔවුහු ද සිය මව්වරුන් සමඟ මෑතක දී සිර ගත වූ ළමුන් ය. සිරගත වීම හේතුකොටගෙන ලද මානසික බලපෑම ආදිය නිසා පෙර පාසලට නොයන බව පෙර පාසල් පාලිකාව ප්‍රකාශ කළේ ය.

ළමුන්ට අවශ්‍ය කරන විශේෂ බෙහෙත් වර්ග බන්ධනාගාරයෙන් ලබාගත හැකි තත්වයක් නොමැත. බෙහෙත් හෝ විශේෂ කිරිපිටි වර්ග ලබා ගත හැක්කේ රැඳවියන් බැලීමට නිවසින් එන උදවිය හරහා ය. ඇතැම් විට සර්වෝදය හෝ වෙනත් රාජ්‍ය නොවන ආයතනවලින් ආහාර හා බෙහෙත් වර්ග ලබා දෙනු ලැබේ. ගර්භණී හෝ ළමුන් සිටින සියලු ම රැඳවියන්ට ආහාර හා බෙහෙත් වර්ග ලබා දෙනු ලැබේ. වයස අවුරුදු 1 1/2 ට අඩු ළමුන්ට බන්ධනාගාරය මගින් කිරිපිටි ලබා දෙන අතර එම වයසට වඩා වැඩි දරුවන්ට කිරිපිටි ලබා නොදෙන අතර ඝන ආහාර සඳහා ඔවුන් යොමු කළ යුතු ය. නමුත් ළදරුවන් එකවරම ඝන ආහාරවලට හුරු නොවන බවත් ඔවුන් කිරිපිටි ඉල්ලා සිටින බවත් රැඳවියෝ ප්‍රකාශ කළෝ ය. "බබාට කිරිපිටි හරියට ලැබෙන්නේ නැහැ. ලැබෙන කිරිපිටි ප්‍රමාණවත් නෑ. විසිටර්ස්ලා (ගෙදරින් හෝ රැඳවියන් බැලීමට එන ඥාතීන් ) එන්නේ නෑ" (පල්ලියගුරුගේ 2009: රැඳවිය 19). තත්ත්වය තවත් උග්‍ර වන්නේ ඇතැම් රැඳවියන් බැලීමට කිසිම ඥාතියකු නොපැමිණෙන අවස්ථා ද තිබෙන


නිසා ය. එවිට ළමයාට දියයුතු සියලු ම ආහාර ඇඳුම් හෝ බෙහෙත් වර්ග බන්ධනාගාරය මගින් හෝ ප්‍රජා සංවිධාන මඟින් දෙන තෙක් බලා සිටීමට සිදු වේ.

"බබාගේ නළලේ ලේ ගෙඩියක් තියෙනවා. වරින් වර ලේ බිංදු එනවා. ඩොක්ටර්ට පෙන්නුවා. එළියෙන් ගාන්න ක්‍රීම් එකක් ලියලා දුන්නා. ගන්න විදියක් නෑ. විසිටර්ස්ලා එන්නේ නෑ." (පල්ලියගුරුගේ 2009: රැඳවිය 13). ත්‍රිත්ත්ව එන්නත් ආදි ලබා දිය යුතු විශේෂ එන්නත් වෙලාවට ලබා දීමට නොහැකි වන අවස්ථා ඇත. ඇතැම් විට එන්නත් ලබා දෙන අවස්ථාවේ දී දරුවන්ගේ වයස් පූර්ණත්වය සිදු ව ඇත. මෙම තත්ත්වය නිලධාරි හිඟය මත සිදු වන බව නිලධාරීහු ප්‍රකාශ කරති. "ළමයි (නිලධාරිහු ඇතැම් විට රැඳවියන් ළමයි යනුවෙන් අමතති) එළියට අරන් යන්න අපේ නිළධාරියන් පස් දෙනෙක්වත් අඩුම තරමින් ඕන. ඒවාගේම උසාවි දිනවලදී ළමයින් ව රෝහලකට ගෙනියන්න බෑ. එතකොට නිලධාරීන් වැඩි පිරිසක් එළියේ. (පල්ලියගුරුගේ 2009: නිලධාරි 3) මෙම නිසා එන්නත් ලබා දීමට රෝහලට රැඳවියන් ගෙන යා නොහැකි බව දක්වයි. නමුත් රෝහලේ හෙදියන් පැමිණ එන්නත් ආදිය ලබා දෙන බව නිලධාරිහු ප්‍රකාශ කරති. කිරිපිටි ප්‍රශ්නය ප්‍රබල අයුරින් බලපාන බව නිරීක්ෂණය කළ හැකි විය. කිරිපිටි බන්ධනාගාරය මගින් නිකුත් කරනු ලබන්නේ වයස අවුරුදු 1 1/2 ට අඩු දරුවන් සඳහා ය. එම කිරිපිටි ප්‍රමාණය ලබා ගැනීමට පෝලීමේ ගොස් අයදුම් කළ යුතු අතර අයදුම් නොකළ අයට කිරිපිටි ලබා නොදීමට කටයුතු කරයි. විශේෂයෙන් ම ළමයාගේ මව අසනීප වී සිටින අවස්ථාවක දී කිරිපිටි අයදුම් කිරීමට යා නොහැකි වූ විට කිරිපිටි නොලැබී යයි. කිරිපිටි නොදෙන ළමුන්ට ඝන ආහාර ලබා දීමට කටයුතු කළ යුතු ය. වැඩිහිටි රැඳවියන්ට හිමිවන ඝන ආහාර ළමුන්ට ද ලබා දීම මෙහි දී පැනනගින ප්‍රධාන ගැටළුවක් වේ. දරුවන්ට පෝෂ්‍යදායී ආහාර අවශ්‍ය වුව ද මව්වරුන් සමඟ සිරගත ළමුන්ට එවැනි ආහාර නොලැබේ. මව්වරුන්ට ලැබෙන සිරබත ළමුන්ගේ ද ආහාරය වේ (ලියනගේ, 2001: 90). මේ නිසා ළමුන් ආහාර ප්‍රතික්ෂේප කරන අතර කිරිපිටි ඉල්ලා සිටින බව රැඳවියෝ ප්‍රකාශ කරති. තම දරුවන්නේ ශරීරවල සමේ ලෙඩ රෝග සෑදී ඇති බව රැඳවියෝ අතරින් 55%ක් ම ප්‍රකාශ කරන කළෝ ය. ළමුන් සියලු දෙනා පොදු සිර මැදිරිවල සිටීම මෙම රෝගී තත්ත්වයට බල පා තිබෙන එක් ප්‍රබල හේතුවක් වේ (ප්‍රස්තාර සටහන 3).




**(කොළඹ මැගසින් බන්ධනාගාරය ආශ්‍රිත ව කරන ලද නියැදි සමීක්ෂණය 2009)**
**ප්‍රස්තාර සටහන 3: මව්වරුන් සමඟ බන්ධනාගාරගත වී සිටින දරුවන් බන්ධනාගාරයේ දී රැඳී සිටින ස්ථානයේ ස්වභාවය**

එම රෝගී තත්ත්වය ක්‍රමයෙන් වර්ධනය වන අතර බෙහෙත් ලබා දුන්න ද ඉ
ප්‍රතිඵල ලබා ගත නොහැක. බෙහෙත් ලබා ගැනීමෙන් පසුව ද පොදු සිරමැදි
හෙවත් වාට්ටුවල නැවතීමට සිදු වීම එයට හේතුව වේ. චර්ම රෝග වැළැක්වීම
නිරතුරු උත්සාහ ගන්නා අතර 'ඒ සඳහා රෝගීන් ප්‍රතිකාර ගැනීමට බන්ධනාගා
රෝහල වෙත යොමු කරන බව නිලධාරීහු ප්‍රකාශ කරති. එහෙත් චර්ම රෝගී තත්ත්ව
සම්පූර්ණයෙන් ම පාලනය නොවන බවත් රැඳවියන්ගේ අපිරිසිදුකම ද ඒ සඳහ
බලපාන බවත් නිරීක්ෂණය කළ හැකි විය. විශේෂයෙන් ම ස්නානය කිරීම නිසි පරි
සිදු නොවීම, අනෙක් රැඳවියන් ආශ්‍රය කිරීම සහ ඔවුන්ගේ ඇඳුම් පරිහරණය කිරී
වැනි හේතු නිසා රෝගී තත්ත්වය පළමු ව මවට ද දෙවනුව දරුවන්ට ද ඇතිවන බ
නිලධාරීහු ප්‍රකාශ කළහ. දරුවන් සිටින මව්වරු අතරින් 55% ක් ම පොදු මැදි
හෙවත් වාට්ටුවල ජීවත් වෙති. මෙම සියලු දෙනාට ම භාවිතය පිණිස වැසිකිළි
දෙකක් පමණක් ඇත. එසේ ම එම වැසිකිළි භාවිත කිරීමේ දී දැඩි දුෂ්කරතාව
පවතී. වාට්ටුවේ සිටින රැඳවියෝ සිමෙන්ති පොළවේ නිදා ගනිති. මෙම පිරිසට ලබ
දී ඇති පැදුරු ප්‍රමාණවත් නොවේ. ඇතැම් රැඳවියෝ රෙදි කැබැල්ලක් දමා ගෙ
නිදා ගනිති. "මාගේ බබාලා දෙන්නා සමග සිමෙන්ති පොළවේ නිදා ගන්නේ
වැසිකිළි ගිහින් එන අයගේ කකුල්වල සියලු ජරාව සිමෙන්ති පොළවේ සිටින අ
දරුවන්ගේ ඇඟේ ගෑවෙනවා. ඒවාගේ ම තමයි ලීඩර්ලාගෙන් එන ප්‍රශ්න. පැදු
ඉල්ලුවම දෙන්නේ නෑ" (පල්ලියගුරුගේ 2009: රැදවි 6). කොටුව ලෙස හැඳින්වෙන්
සිර මැදිරිය තුළ රැඳවියන් 6 දෙනෙකු සිටින බිම් ප්‍රමාණය වේ. මෙම "කොටු
නිරතුරුව ම පිරිසිදු ව තබා ගැනීමට රැඳවියන් උත්සාහ කරන ආකාරය නිරීක්ෂණ
කළ හැකි ය. එළියට ආසන්නයේ තිබෙන කොටු වතුරෙන් සෝදා පිරිසිදු කර
ලැබේ. නමුත් ඇතුළත ඇති කොටු පිරිසිදු කළ නොහැකි ය. එම නිසා ඇතුළ
සිටින පිරිස අතරේ විෂබීජ මගින් ලෙඩ බෝවීමේ හැකියාව වැඩි ය. සිරගත වූ ප
දරුවන් ප්‍රසූත කළ රැඳවියන් 41ක් සිටින අතර ඔවුන් අතරින් 23% ක් සායනි
පහසුකම් නිසි පරිදි සිදු නොවූ බව ප්‍රකාශ කළ හ. අනෙක් අතට 18% ක් සායනි
පහසුකම් සතුටුදායක මට්ටමක පැවති බව ප්‍රකාශ කළ හ ප්‍රස්තාර සටහන 4.





ප්‍රස්තාර සටහන 4 : සායනික පහසුකම් පිළිබඳ තත්ත්වය
(කොළඹ මැගසින් බන්ධනාගාරය ආශ්‍රිත ව කරන ලද නියැදි සමීක්ෂණය 2009)

මළ දරු උපත් සිදු වීමට බලපාන ප්‍රධාන හේතුවක් ලෙස සායනික පහසුකම් නිසි ලෙස නොපැවැත්වීම ද පවතින බව රැඳවියෝ ප්‍රකාශ කළහ. "මගේ පළමු බබා ලැබෙන්න ඉද්දි මං ඇතුළේ හිටියේ. ක්ලිනික් හරියට පැවැත්තුවේ නෑ. බබා බඩ ඇතුළේ දඟලන්නේ නැති වග දැනුණා. බබා ඉපදෙන කොට මැරිලා" (පල්ලියගුරුගේ 2009: රැඳවි 20). මළ දරු උපත් දෙකක් සිදු වූ බව නිලධාරීන් පිළිගනු ලබන අතර එයට ප්‍රධාන හේතුව ලෙස ගර්භණී සමයේ මත් ද්‍රව්‍ය ලබා ගැනීම බව ඔවුහු දක්වති. සිරගත වී සිටින පිරිසෙන් 77% ක් මත් ද්‍රව්‍ය විකිණීම හෝ ළඟ තබා ගැනීම යන චෝදනාවන්ට වැරදිකරු හෝ චෝදනා ලබා සිටින්නන් ය. මත්ද්‍රව්‍ය විකුණන පිරිසෙන් 50% ක පිරිසක් මත්ද්‍රව්‍ය භාවිත කරන බව සමාජ නිරීක්ෂණවලින් හෙළි වේ. එම නිසා ද මළ දරු උපත්වලට ප්‍රධානතම හේතුව මත්ද්‍රව්‍ය භාවිතය බව සඳහන් කළ හැකි ය. නමුත් මාතෘ සායනයක් නොපැවැත් වීම ද එයට යම් දුරකට බලපාන බව පෙන්වා දිය හැකි ය. එම නිසා ඉපදීමට පෙරසිට ම ළමුන්ගේ ජීවත් විමේ අයිතියට බලපෑම් එල්ලවල බව පිළිගත හැකි ය.

මේ අනුව බන්ධනාගාරය තුළ දී දරුවන්ගේ පෝෂණය සහ සෞඛ්‍ය පිළිබඳ ව විවිධ දුෂ්කරතා පවතින බව පැවසිය හැකි ය. බන්ධනාගාර නිලධාරීන්ට හැකි උපරිමයෙන් දරුවන්ගේ පෝෂණයට හා සෞඛ්‍යයට අදාළ තත්ත්වයන් වැඩි දියුණු කිරීමට ඔවුන් පියවර ගෙන ඇතත් තවමත් බන්ධනාගාර තුළ මව සමඟ සිරගත වී සිටින ළමුන්ගේ පෝෂණය සඳහා වූ අයිතිය ඉටු වීමේ දී ගැටළුකාරි තත්ත්වයන් මතු වී ඇති අයුරු හඳුනාගත හැකි ය.

## මානසික හා කායික සංවර්ධනයට සිදුවන බලපෑම

බන්ධනාගාරය තුළ ජීවත් වන ළමුන්ගෙන් 70% ක් පමණ පිරිසක් සිය මව සමඟ ම සිරගත වී ඇත. ඉතිරි 30% කළලයක් ලෙස සිරගත වී බන්ධනාගාරය තුළ දී උපත ලබා ඇත ප්‍රස්තාර සටහන 5.




**ප්‍රස්තාර සටහන 5 : මව්වරුන් සමඟ සිරගත වුණු දරුවන් උපත ලද ස්ථානය (කොළඹ මැගසින් බන්ධනාගාරය ආශ්‍රිත ව කරන ලද නියැදි සමීක්ෂණය 2009)**

මව්වරු සමඟ සිරගත වුණු ළමුන්ගේ මානසික හා කායික සංවර්ධනය පිළිබඳ විමසීමේ දී සිරගත වීම නිසා ඔවුන්ට මානසික බලපෑමක් එල්ල වී ඇති අයුරු හඳුනාගත හැකි ය. එම ළමුන් බන්ධනාගාරගත වූ මුල් දින කිහිපය බිය වී මව සමඟ ම රැඳී සිට ඇත. එසේම තම සහෝදර සහෝදරියන් ගැන නිතර නිතර විමසා ඇති අතර එම නිසා ම සාංකාව සහිත උණ සෑදී ඇත. බන්ධනාගාරයේ දී මෙම දරුවන් නිරතුරු මුළුගැන් වී මව සමඟ ම කල් ගත කරන ආකාරය හඳුනාගත හැකි ය. නමුත් බන්ධනාගාරයේ උපත ලද දරුවන් වඩා මිත්‍රශීලී ලෙස හැසිරෙන ආකාරය නිරීක්ෂණය කළෙමු. මෙම තත්ත්වය ඇති වන්නේ බන්ධනාගාරය තුළ උපත ලද දරුවෝ සිය ඥාතීන් ලෙස බන්ධනාගාරයේ සිටින අනෙකුත් රැඳවියන් සලකා ගැනීම එවැනි මිත්‍රශීලී හැසිරීමක් ඔවුන් කෙරෙන් පිළිබිඹු වීමට බලපාන ප්‍රධාන හේතුවක් විය හැකි ය. මව සමඟ සිරගත වන දරුවන් බාහිර සමාජයේ දී ඔවුන් අත්විඳි සමාජ පරිසරය හෝ ඥාතීන් හෝ බන්ධනාගාර පරිසරයේ දක්නට නොමැති වීම ළමුන්ගේ මානසික තත්ත්වය වෙනස් වීමට බලපාන්නට ඇත. විශේෂයෙන් ම මව සමඟ සිරගත වන ළමුන්ගෙන් වැඩි ප්‍රමාණයක් වයස අවු: 12 අතර ළමුන් ය. "බබාට අවු: 1යි මාස10යි. එයා මෙහෙට ආවාට පස්සේ කම්පනයකින් වගේ සිටියා. ගෙදර යන් කියනවා. අක්කා ඕන කියනවා. මෙයාට මුල් දවස්වල නිතර ම සංකාවට උණ ගත්තා "(පල්ලියගුරුගේ 2009: රැඳවි 10) මෙවැනි කුඩා වයසක දී බන්ධනාගාරයක් තුළ ජීවත්වීමට සිදු වීමෙන් ඔවුන්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියට සහ පෞරුෂයට සිදු විය හැකි හානිය අතිමහත් ය. මේ අනුව සිය මව්වරු සමඟ වුවත් කුඩා ළමුන් බන්ධනාගාරගත වීමට සැලැස්වීමෙන් ඔවුන්ගේ මානසිකත්වයට අත්විඳීමට සිදු වන අයහපත් බලපෑම ඉතා ඇඩි බව හඳුනාගත හැකි ය.

දරුවන්ගේ මානසික තත්ත්වයට බලපාන තවත් සාධක රාශියක් බන්ධනාගාරය තුළ ඇත. ඒ අතර මත්ද්‍රව්‍ය ප්‍රධාන සාධකයක් වේ. බන්ධනාගාරයට මත්ද්‍රව්‍ය පැමිණෙන්නේ කෙසේ ද යන්න බන්ධනාගාර නිලධාරීහු පවා නො දනිති. නමුත් බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍ය භාවිතය ඉතා සාර්ථක ව සිදු වන බව රැඳවියෝ පවසති. බන්ධනාගාරය ඇතුළත ඇති සීමිත ඉඩකඩෙහි නිතර සෙල්ලම් කිරීමට යන දරුවෝ වැඩිහිටි රැඳවියන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන ආකාරය දකිති. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර ආශ්‍රිත පර්යේෂණයන්හි නිරත වුණු පර්යේෂිකාවක් වන ශානිකා ශ්‍රියානන්ද ඇයගේ අත්දැකීම් මෙසේ විස්තර කරයි. "ක්‍රීඩාවක් පිළිබඳ චිත්‍රයක් අඳින්නට දුන් උපදෙසට කුඩා දැරිය ඇඳ තිබූ චිත්‍රය දුටු විට හදවත කම්පා කරවයි. ඇය ක්‍රීඩාවක් ලෙස අඳ ඇත්තේ කඩදාසි කොළයක් දල්වා ඊයම් කොළයක් රත් කරමින් කුඩු දුමාරයෙහි ආශ්වාදය ලබන සිරකාරියකගේ චිත්‍රයකි (ලියනගේ 2001: 93). සම්මුඛ සාකච්ඡා සඳහා සහභාගී වූ බොහෝ රැඳවියන් විසින් මත්ද්‍රව්‍ය නිසා තම දරුවන්ට සිදුවන අහිතකර බලපෑම පිළිගනු ලැබුව ද ඔවුන් අතුරින් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය වෙළෙඳාම් කර සිරගත වූවන් ය. මෙම අදහසට පරස්පර අදහස් ප්‍රකාශ කරන රැඳවියෝ ද ඒ අතර වූහ. ඔවුන්ගේ අදහසට අනුව බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍ය භාවිතය දරුවන්ට අලුත් අත්දැකීමක්. ඔවුන්ට අනුව "අපේ ගමේ වැඩි දෙනෙක් මෙහේ ඉන්නවා. ගමේදී කුඩු ගහන හැටි බබා දැකලා තියෙනවා. ඉතින් මෙහෙ දී දැක්කට එකේ වෙනසක් ෆ

දකින්නේ නෑ "(පල්ලියගුරුගේ 2009: රැඳවි 14). එහෙත් බන්ධනාගාරයේ දී ම උපත ලබන දරුවෝ මත්ද්‍රව්‍ය පිළිබඳ සිය පළමු අත්දැකීම බන්ධනාගාරයේ දී ම ලබාගන්නා බව පෙන්වා දිය හැකි ය.

පොදු සිරමැදිරිවල රඳවා ඇති රැඳවියන්ට තවත් පොදු ප්‍රශ්නයක් ඇත. එනම් අසම්මත ලිංගික චර්යාවන් ය. අසම්මත ලිංගික ක්‍රියා දිගින් දිගට ම බන්ධනාගාරය තුළ සිදුවන අතර ඇතැම් විට ඔවුන් අතර ගැටුම් ද ඇති වේ. බොහෝ දිනවල රාත්‍රී කාලයේ දී වාට්ටුවවල රණ්ඩු ඇතිවන බව රැඳවියෝ ප්‍රකාශ කළහ. මෙම නිසා ළමුන් බය වී නැගිටින අතර එම ක්‍රියාවන් දැකීම හේතුකොට ගෙන ළමුන්ගේ මනස ව්‍යාකූල තත්ත්වයන්ට පත් වනබව රැඳවියෝ ප්‍රකාශ කළහ. අතැම් විට දිවා කාලයේ දී පවා තම දරුවන් සමඟ වාට්ටුවෙන් පිටතට වී සිටිමට සිදු වී ඇතැයි රැඳවියෝ ප්‍රකාශ කළහ. මෙම තත්ත්වය නිසා දිගින් දිගට ම බන්ධනාගාරයේ දී ළමුන්ට සිදුවන මානසික බලපෑම වැඩි වේ. මෙම තත්ත්වය පාලනය කළ නොහැකි බැව් බන්ධනාගාර නිලධාරිනියනියෝ ප්‍රකාශ කරති. බන්ධනාගාරය තුළ ජීවත්වන සමස්ත දරුවන්ගෙන් 70% ක් ම ජීවත් වන්නේ මෙවැනි ගැටුම්කාරී, අසම්මත ලිංගික චර්යා ඇති පොදු සිරමැදිරිවල ය. එම ළමුන්ගේ මානසික වර්ධනය බාල කිරීමට බන්ධනාගාරය තුළ පවතින අසම්මත ලිංගික චර්යාවන් දැඩි ව බලපානු ඇත. බන්ධනාගාරය තුළ ම ඉපදී එහි දී හැදී වැඩෙන දරුවන්ට බාහිර සමාජය පිළිබඳ දැනුමක් නැත. කාන්තා රැ ඳවියන් සහ නිලධාරිනියන් පමණක් සිටින සිරකඳවුරට වරින්වර පැමිණෙන බන්ධනාගාර නිලධාරීන් හෝ නීති ශිෂ්‍යයන් හෝ අප වැනි පර්යේෂකයන් විශේෂයෙන් ම පිරිමි පුද්ගලයන් පැමිණි විට ඔවුන් දෙස කුඩා දරුවන් බලා සිටින්නේ අමුතු පුද්ගලයන් පරිදි ය. මේ කවුරුන් ද යන්න තේරුම් ගැනීමට ඔවුන්ගේ මනස විවෘත නොවන බව නිරීක්ෂණය කළ හැකි විය. බාහිර සමාජයේ ස්ථාන හෝ ද්‍රව්‍යාත්මක දේවල් ඔවුන්ට එකවර තේරුම්ගත නොහැකි ය. විශේෂයෙන් ම සර්වෝදය පෙර පාසල සහ කොළඹ ඔවසිත් ජාත්‍යන්තර පාසල මඟින් බන්ධනාගාරයේ පෙර පාසල් යන දරුවන් වසරකට තෙවරක් විනෝද චාරිකා සඳහා බන්ධනාගාරයෙන් එළියට ගෙන යනු ලැබේ. පෙර පාසල් පාලිකාව ප්‍රකාශ කළ ආකාරයට විශාල ගොඩනැගිලි, ගංගා, මුහුදු ආදිය ගැන දරුවන් විස්මිත වී සිටි අතර විවිධ ප්‍රශ්න අසන ලද බව ය. මෙම තත්ත්වය කෙරෙන් බන්ධනාගාරය තුළ සිර වී සිටින ළමුන්ගේ මානසික තත්ත්වය වඩ වඩාත් තේරුම් ගත හැකි බව පෙර පාසල් පාලිකාව ප්‍රකාශ කළා ය. දරුවන්ගේ මානසික සහ කායික වර්ධනයට ක්‍රීඩාව අත්‍යවශ්‍ය වන බව ළමා මනෝ විද්‍යාඥයන් පිළිගෙන ඇති මතයකි. ක්‍රීඩාව මඟින් දරුවා සම්පූර්ණයෙන් ම චිත්ත චේගීයාව, කායික ව මෙන් ම මානසික ව ද නිරත කරවයි. ගැටළු විසඳීම සහ ආත්ම ධෛර්යය වැඩි දියුණු කරයි (කාරියවසම් 1998: 49). මෙම මතයට අනුව ක්‍රීඩාව ළමුන්ගේ මානසික සෞඛ්‍යයට ඉතා වැදගත් ය. නමුත් බන්ධනාගාරය තුළ දී ළමුන්ට ක්‍රිඩා කිරීමේ පහසුකම් ඉතා අඩු ය. පෙර පාසල පිහිටා ඇති ප්‍රදේශයේ කුඩා ළමා උද්‍යානයක් පිහිටා තිබුණ ද බොහෝ මව්වරු තම දරුවා එහි යැවීමට මැලිවෙති. ඇතැම් රැඳවියෝ තැන් තැන්වල සිට මත්ද්‍රව්‍ය භාවිත කීරිම එයට ප්‍රධාන හේතුව වේ. කෙසේ නමුත් බන්ධනාගාරය තුළ දී දරුවන්ට ඇති ක්‍රීඩා සීමා සහිත ය. එනම් මව සිටින ස්ථානයේ සිට පෙර පාසල දක්වාත් නැවත මව සිටින ස්ථානය දක්වාත්

දිවගෙන යාම පමණි. ඇතැම් විට ඔවුහු පෙර පාසලේ ඇති ඔංචිල්ලාව පැදීම කරති. ළමුන් විශාල පිරිසකට තම වාරය එනතුරු බලා සිටීමට සිදු වීම නිසා බොහෝ විට එය ද කළ නොහැක්කේ ය. යම් මට්ටමකින් හෝ ක්‍රීඩාශීලීත්වයක් විශද කෙරෙන්නේ බන්ධනාගාරයේ දී උපත ලද දරු දැරියන් වෙතින් පමණි. මව්වරුන් සමඟ සිරගත වූ ළමුන් මෙවැනි කිසිදු ක්‍රීඩාවක් කිරීමට යොමු නොවන අතර නිතර ම මව සමඟ රැඳි සිටින ආකාරය නිරීක්ෂණය කළ හැකි විය.

බන්ධනාගාරය තුළ දී ළමුන්ගේ මානසිකත්වය වෙනස්වන තවත් අවස්ථාවක් ලෙස ඔවුහු වැඩිහිටියන්ට ගරු කිරීමට නොපෙළඹීම මගින් පෙන්වා දිය හැකි ය. බන්ධනාගාරයේ දී කිසිදු දරුවකුට නැන්දා, ආච්චි, පුංචි අම්මා හෝ ලොකු අම්මා, අක්කා වැනි ඥාතීහු නැත. සිය මව්වරුන් සමඟ බන්ධනාගාර ගත වුණු ළමයි වැඩිහිටි රැඳවියන් සියලු ම දෙනාව ම ඔවුන්ගේ නමින් ආමන්ත්‍රණය කරති. නැතහොත්, බන්ධනාගාර නිළධාරිනියන් රැඳවියන් ආමන්ත්‍රණය කරන ආකාරයට 'අච්චු' යනුවෙන් බන්ධනාගාරගත දරුවෝ ද අනෙක් රැඳවියන් ව ආමන්ත්‍රණය කරති. බන්ධනාගාරයේ ඇති මත්ද්‍රව්‍ය භාවිතය, අසම්මත ලිංගික චර්යා, ක්‍රීඩා පහසුකම් නොමැතිවීම ආදී හේතු සාධක නිසා ළමයාගේ මානසික වර්ධනයට බලපෑම් එල්ල වී ඇති අයුරු පැහැදිලි වේ. එසේම මව සමඟ ම සිරගත වන ළමුන් දැඩි මානසික ආතතියකට ගොදුරුවන ආකාරය පැහැදිලි ය. විශේෂයෙන් ම විවිධ අපරාධ සඳහා දඬුවම් හෝ චෝදනා ලබා සිටින පිරිස් සමඟ සිටීමෙන් දරුවාට අපරාධ කිරීමට ඇති බිය පහව යන අතර පූර්ව අපරාධ මානසිකත්වයකින් යුතු ව යම් දිනයක එම දරුවන් බන්ධනාගාරයෙන් එළියට පැමිණීමට ඉඩ තිබේ.

## සෙනෙහස සහ රැකවරණය අහිමිවීම

බන්ධනාගාරයේ දී දරුවන්ට හිමි විය යුතු සෙනෙහස සහ රැකවරණය නිසි පරිදි ලැබේ ද යන්න පැන නගින තවත් ගැටළුවක් වේ. විශේෂයෙන් ම මත්ද්‍රව්‍ය භාවිතය හෝ විකිණීම හේතුකොටගෙන සිරකර ඇති රැඳවියන්ගෙන් ඔවුන්ගේ දරුවන්ට හිමි විය යුතු සෙනෙහස අහිමි වී යන අයුරු හඳුනා ගත හැකි ය. ඇතැම් රැඳවියන් දැඩි ලෙස සිරගත කර ඇත. මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ චෝදනා ලැබ පාලනය කර ගත නොහැකි අන්දමට මත්ද්‍රව්‍යය ලබා ගන්නා රැඳවියන් ඒ ආකාරයට දැඩි ලෙස සිරගත කර ඇති ආකාරය හඳුනා ගත හැකි ය. එ වැනි රැඳවියන් සමඟ ඔවුන්ගේ දරුවන් ද බන්ධනාගාරගත කර ඇති විට එම ළමයි වෙනත් රැඳවියන් විසින් බලා ගනු ලැබෙති.

"බබාගේ අම්මා ෂෙල් එකේ ඉන්නේ, බබාට දවස් 21 ඉඳලා බලා ගත්තේ මම. දවස 21 ඉඳන් දෙන්නේ කිරිපිටි විතරයි" (පල්ලියගුරුගේ 2009: රැඳවි 14). තම මවගේ සෙනෙහස අහිමි වූ මෙම දරුවාට වෙනත් රැඳවියක් මව වී ඇත. මත්ද්‍රව්‍ය ලබා ගන්නා සියලු ම රැඳවියන් තම දරුවන් පිළිබඳ යොදවන අවධානය අවම මට්ටමක පවතින බව නිලධාරිනියෝ ප්‍රකාශ කළෝ ය. මෙවැනි මව්වරුන් නිසා දරුවන්ට මව් සෙනෙහස පමණක් නොව ජීවත් වීමට අත්‍යවශ්‍ය රැකවරණය පිළිබඳ අයිතිය ද

ඇතැම් විට අහිමි වී යයි. මව සමඟ දරුවන් සිර ගත කරනු ලබන්නේ දරුවාගේ උපරිම යහපත ඉටු කර දීම සඳහා ය. නමුත් මව මත්ද්‍රව්‍ය ලබාගෙන සිහිවිකල් අවස්ථාවල පසුවන විට දී එම දරුවාගේ උපරිම යහපත ඉටු වන්නේ කෙසේ ද යන්න ගැටළුවක් වේ. මව දැඩි ලෙස සිර ගත කර ඇති විට දී දරුවාට හිමිවන රැකවරණය නිසි අයුරින් ලැබෙන්නේ ද යන්න උද්ගත වන තවත් ප්‍රශ්නයකි. අනෙක් රැඳවියෝ දරුවන් කෙරෙහි ඇති සෙනෙහසින් යුතු ව දරුවන් රැක බලා ගැනීමට ඉදිරිපත් වෙති. දරුවන් සිටින සමස්ත රැඳවියන්ගෙන් 22% ක් සඳහා සුවිශේෂ පහසුකමක් ලෙස දිවා සුරැකුම් මධ්‍යස්ථානය තුළ ජීවත් වීමට ඉඩ ලබා දී ඇත. එහි රැඳී සිටීම මඟින් ඔවුන්ට සුවිශේෂ වූ රැකවරණයක් ලැබීමේ අයිතිය හිමි ව ඇත. දරුවන් සිටිනා සමස්ත රැඳවියන් ප්‍රමාණයෙන් 78% ක් සිටින්නේ පොදු සිර මැදිරිවල ය. එහිදී ඇතැම් විට මව දැඩි ලෙස සිර ගත කර සිටින අවස්ථා ඇත. පොදු සිර මැදිරිවල සිටිනවිට අනෙක් රැඳවියන්ගේ ක්‍රියා කලාපයන් නිසා දරුවාගේ රැකවරණය අහිමි ව යෑම එවන් දරුවන් මුහුණ දෙන ප්‍රබලතම අවදානම වේ. ඇතැම් මව්වරුන් මත්ද්‍රව්‍ය සඟවා තබා ගත හැකි උපකරණයක් ලෙස දරුවන් භාවිත කරන බව නිලධාරිහු ප්‍රකාශ කළහ. දරුවාගේ ඇඳුම් තුළ මත්ද්‍රව්‍ය කුඩා ප්‍රමාණයක් පැකට් වශයෙන් සකස් කර සඟවා තබා පසුව අවශ්‍ය වන අවස්ථාවේ එළියට ගනු ලැබේ. මෙම නිසා මත්ද්‍රව්‍ය ලෝලි වෙනත් රැඳවියකට දරුවා තුළ සඟවා ඇති මත්ද්‍රව්‍යය පිළිබඳ සැකයක් මතු වූ විට දරුවාට සිදුවන හිරිහැර පිළිබඳ තැකීමක් නොකර ම එම ද්‍රව්‍ය රැගෙන පලා යෑම නිසා එම රැඳවියගෙන් සහ තම මවගෙන් යන දෙදෙනාගෙන් ම දරුවා පීඩනයට ලක් වේ. රැකවරණය ලැබීමේ අයිතියත් මානසික ව යහපත් පරිසරයක ජීවත්වීමේ අයිතියත් දරුවාට අහිමිවීම මෙමඟින් සිදුවන්නේ ය.

එසේ ම ලිංගික සේවා සපයන්නියන්ගේ දරුවන්ට මවගේ සෙනෙහස දැඩි ලෙස අහිමි වී යාම නිරීක්ෂණය වන බව බන්ධනාගාර නිලධාරීනයෝ ප්‍රකාශ කරති. එයට හේතුව දරුවාගේ පියා පිළිබඳ ව පවතින අවිනිශ්චිතතාවත් දරුවා සිටීමෙන් නැවත තම කටයුතු ආරම්භ කිරීමට බාධා වීමත් ය. එම නිසා මෙම දරුවන්ට බොහෝ විට හිමිවන්නේ අසල්වැසි රැඳවියන්ගේ සෙනෙහස මිස මවගේ සෙනෙහස නොවේ. දරුවාගේ යහපත උදෙසා මව සමඟ සිරගත කළ ද එමඟින් දරුවන්ගේ අයිතීන් උල්ලංඝණය වන්නේ ය.

## මව්වරුන් සමඟ සිරගත වී සිටි නිසා අහිමි ව යන අනෙකුත් අයිතීන්

මව්වරුන් සමඟ සිරගත වී සිටිම නිසා මූලික ලෙස ම අහිමි ව යන අයිතීන් කිහිපයක් හඳුනාගත හැකි ය. ඒ අතර පෝෂණය සඳහා වූ අයිතිය නිසි ලෙස ඉටු නොවීම, මානසික සහ කායික සංවර්ධනය අවම වීම, සෙනෙහස විශේෂයෙන් ම මවගේ සෙනෙහස අහිමි වීම, ආදිය ප්‍රමුඛ වේ. මෙම අයිතීන්ට අමතර ව බන්ධනාගාරගත කිරීම මගින් ළමුන්ට අහිමි ව යන තවත් අයිතින් ප්‍රමාණයක් ඇත.

පෙර පාසල් යායුතු මට්ටමේ දරුවන් 27% ක් බන්ධනාගාරය තුළ ජීවත් වන ආකාරය හඳුනා ගත හැකි ය. මෙම දරුවන්ගේ අධ්‍යාපනය සඳහා සර්වෝදය මඟින් පවත්වාගෙන යනු ලබන පෙර පාසලත් කොළඹ මවසින් ජාත්‍යාන්තර පාසලත් කැපවී සිටින ආකාරය නිරීක්ෂණය කළ හැකි විය. මෙම පෙර පාසලේ ප්‍රධාන පාලිකාව සහ සහාය පාලිකාවක් සිටින අතර ඉගැන්වීම් උපකරණ සීමා සහිත ය. නමුත් සෑම ළමයෙකුගේ ම අධ්‍යාපනය උදෙසා රජය කැපවිය යුතු බව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සහ එහි උපවගන්ති මඟින් පෙන්වා දී ඇත. 28 වන වගන්තියේ (අ) උපවගන්තිය මඟින් ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්ය කළ යුතු බව දක්වා ඇත. ප්‍රාථමික අධ්‍යාපනයට ළමයි පුරුදු වන්නේ පූර්ව පාසල් අධ්‍යාපනය හෙවත් පෙර පාසල් මඟිනි. පෙර පාසල් රජය මඟින් ක්‍රියාත්මක වීම බහුල නොවුව ද පෙර පාසල් සඳහා පරිත්‍යාගයක් ලබා දීමට රජය කටයුතු කළ යුතු ය. නමුත් බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක වන පෙර පාසලට රජයෙන් ලැබෙන අනුග්‍රහය ප්‍රමාණවත් නොවේ. මෙනිසා බන්ධනාගාරය තුළ දී ළමයාට ලැබෙන අධ්‍යාපනය අඩාළ වීමට රජයේ නොසැලකිල්ල බලපා ඇත. එමෙන්ම ඇතැම් මව්වරුන් ද තම දරුවන්ගේ ඉගෙනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකරන බව පැහැදිලි ය. මෙම නිසා දරුවාගේ අධ්‍යාපනය සඳහා වූ අයිතිය සිය මව්වරුන් සමඟ බන්ධනාගාරගත ව සිටින ළමුන්ට අහිමි ව යන ආකාරය හඳුනා ගත හැකි ය. බන්ධනාගාරගත කර තැබීමෙන් ළමයාගේ ප්‍රකාශන නිදහස සඳහා ඇති අයිතිය ද සීමා වේ. විශේෂයෙන් ළමයාට භාෂාව හසුරුවා හෝ නාට්‍යමය ස්වරූපයෙන් හෝ චිත්‍ර වැනි මාධ්‍යකින් තම අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව ලබා දිය යුතු ය. එසේම සියලු ම ආකාරයේ තොරතුරු සහ අදහස් ලබා ගැනීමට ළමයාට අයිතියක් ඇත. නමුත් බන්ධනාගාරය තුළ සිටින ළමුන්ට මෙම අයිතිය අහිමි ව යන ආකාරය නිරීක්ෂණය කළ හැකි විය. බාහිර සමාජයේ ජීවත් වන දරුවෙකුට මෙන් තොරතුරු ලබා ගැනීමේ හැකියාව බන්ධනාගාරය තුළ ජීවත්වන ළමුන්ට නොමැත. විශේෂයෙන් ම එම ළමයින්ට හුරු පුරුදු වන්නේ "කුඩු, අපරාධ, මිනීමැරුම් "වැනි වදන් ය. ළමාවියට ගැළපෙන කතාන්තර පොත් හෝ සුරාංගනාවියන් සහිත කතා හෝ එම කතාවල ඇති වස්තුන්ට සමාන වස්තූන් දැක ගත නොහැකි ය. ඇතැම් දරුවන් සඳ දැක නොමැත. දිවා කාලයේ දී මව සමඟ සිටින අතර රාත්‍රියේ දී සිර මැදිරි තුළට ගිය පසු රාත්‍රී අහස නිරීක්ෂණය කිරීමට පවා ඔවුන්ට නොහැකි ය.

කෙසේ වුව ද බන්ධනාගාර නිලධාරීන්ට සහ එම දෙපාර්තමේන්තුවට හැකි පරිදි ළමුන් ආරක්ෂා කිරීමට සහ ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමට පියවර ගෙන ඇති ආකාරය නිරීක්ෂණය කළෙමු. එම උත්සාහය පැසසිය යුතු ය. නමුත් මව්වරුන් සමඟ සිරගත කිරීම මගින් ළමුන්ගේ මානසික සංවර්ධනය, පෝෂණය, සෙනෙහස, රැකවරණය ආදි අයිතීන් මූලික ලෙස ම කඩවන ආකාරය හඳුනා ගත හැකි ය. අධිකරණ තීරණ මඟින් මව සමඟ දරුවා රඳවනු ලබන්නේ දරුවාගේ යහපත වෙනුවෙන් ය. නමුත් බන්ධනාගාරගත කිරීම මගින් ළමුන්ගේ අයිතිවාසිකම් නිර්දය සහ අනුවේදනීය ලෙස උල්ලංඝණය වන බව සොයා ගත හැකි විය.

## නිගමන

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් සුරකීම සඳහා විවිධ පියවරයන් ගෙන ඇති ආකාරය නෛතික තත්ත්වයන් යටතේ හඳුනා ගත හැකි ය. එසේම ළමා අයිතිවාසිකම් පිළිබඳ විවිධ අධ්‍යයනයන් ද සිදු කර ඇත. එම සියලු ම අධ්‍යයනයන් එක් පොදු ක්ෂේත්‍රයක ළමා අයිතිවාසිකම් පිළිබඳ ව අධ්‍යයනය කර ඇත. තමන් නොකළ වරදකට තම මව්වරුන් සමඟ සිරගත වීමට ළමුන්ට සිදුවීම හරහා ළමුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය වීම පිළිබඳ සිදු කර තිබෙන අධ්‍යයනයන් සීමා සහිත ය. එබැවින් මෙම අධ්‍යයනය මගින් ළමා අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ නව සොයා ගැනීම් කිහිපයකට ම දායකත්වයක් සැපයිය හැකි විය.

ළමුන්ගේ උපරිම යහපත ආරක්ෂා කිරීම සඳහා ළමුන් ඔවුන්ගේ මව්වරුන් සමඟ සිරගත කළ ද ප්‍රායෝගික ව එමඟින් ළමයාගේ උපරිම යහපත ඉටු නොවන බව පළමු සොයා ගැනීම වේ. විශේෂයෙන් ම විවිධ අපරාධ සහ දුරාචාරවලට චෝදනා හා දඬුවම් ලබා ඇති රැඳවියන් පිරිසක් සමඟ එකට සිටීමෙන් ළමුන්ගේ මානසික සංවර්ධනයට වන අහිතකර බලපෑම විශාල ය. දරුවන් සිටින සහ ගර්භණී අවස්ථාවේ පසුවන රැඳවියන් වැඩි ප්‍රමාණයක් රඳවා ඇත්තේ පොදු සිරමැදිරිවල ය. එම සිරමැදිරිවල ම විවිධ චෝදනා ලැබූ අනෙකුත් රැඳවියන් අතරින් බහුතරයක් ද රඳවා ඇත. විවිධ අපරාධ සඳහා චෝදනා හෝ දඬුවම් ලබා සිටින එම රැඳවියන් සමඟ සිටීමෙන් ළමුන්ගේ යහපත ඉටු වේ ද යන්න ගැටළුවකි. යම්යම් කරුණු පදනම් කරගෙන රැඳවියන් ගැටුම් ඇති කර ගැනීම, මත්ද්‍රව්‍ය භාවිතය ආදී හේතු නිසා ළමුන්ගේ මනසට සිදු වන අහිතකර බලපෑම වැඩි ය. දැඩි ආරක්ෂාව යටතේ ක්‍රියාත්මක වන බන්ධනාගාරයට මත්ද්‍රව්‍ය පැමිණීම ගැටළුවක් වන අතර එමඟින් ළමුන් දැඩි පීඩාවට පත්වීම නිරීක්ෂණය කළෙමු.

සිරමැදිරි තුළ රඳවා තැබීම නිසා දරුවන්ට නිසි සෞඛ්‍යාරක්ෂාවක් ලැබීමේ අයිතිවාසිකමක් ද අහිමි ව යන ආකාරය හඳුනා ගත හැකි ය. විශේෂයෙන් ම පොදු සිරමැදිරිවල චර්ම රෝග පැතිර යන ආකාරය නිරීක්ෂණය කළෙමු. පොදු සිරමැදිරිවල දී නිදා ගැනීමේ පහසුකම් නොමැත. විශේෂයෙන් ම අඩු වයස් මට්ටම්වල ළමුන් වැඩි පිරිසක් මෙබඳු පරිසරයක් තුළ රඳවා තැබීම නිසා නිසි සෞඛ්‍ය සහ ආවරණයක් ලැබීමට ළමයාට අයිතිය කඩ වන බව පැවසිය හැකි ය.

ළමයෙකුට දෙමාපිය සෙනෙහස අත්‍යවශ්‍ය වේ. සිය මව සමඟ සිර ගත කර තැබීමෙන් පිය සෙනෙහස පමණක් නොව මව් සෙනෙහස ද ළමුන්ට අහිමි වන බව පැවසිය හැකි ය. එබැවින් මව සමඟ බන්ධනාගාරගත කිරීමෙන් සැලසෙන ළමයාගේ උපරිම යහපත පිළිබඳ සංකල්පය හුදෙක් සංකල්පයකට ම පමණක් සීමා වන දෙයක් වේ. බන්ධනාගාරගත වී සිටින ළමුන්ට නිසි පෝෂණයක් සහිත ආහාර ලබා ගැනීමේ හැකියාව අවම මට්ටමක පැවතීම නිසා ළමුන්ගේ පෝෂණය සඳහා වූ අයිතිය ද උල්ලංඝණය වන ආකාරය පැහැදිලි ය.

කුඩා ප්‍රමාණයේ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් බන්ධනාගාරය තුළ ස්ථාපිත කර තැබීම පැසසිය යුතු කරුණකි. එම නිසා ළමුන්ගේ රැකවරණය පිළිබඳ ගැටළුවට යම් පිළියමක් ලැබී ඇතැයි විශ්වාස කළ හැකි ය. දිවා සුරැකුම් මධ්‍යස්ථානය මඟින් සුළු ළමුන් පිරිසකගේ හෝ විශේෂ රැකවරණය ඉටු වන ආකාරය හඳුනා ගත හැකි ය. නමුත් එම රැකවරණ ප්‍රමාණවත් නොවන බැවින් බන්ධනාගාරය තුළ සිටින පූර්ව පාසල් අධ්‍යාපනය ලැබිය යුතු ළමුන්ගේ අධ්‍යාපන අයිතිය රැක දීම අවශ්‍ය වේ.

මව්වරුන් සමඟ බන්ධනාගාරගත කිරීමෙන් ළමුන්ගේ උපරිම යහපත අපේක්ෂා කළ ද බන්ධනාගාරය තුළ දී ළමුන්ගේ අයිතිවාසිකම් කඩ වන බව මේ අනුව නිගමනය කළ හැකි ය. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සහ එහි නිලධාරීන් උපරිම උත්සාහගත්ත ද ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට තවත් බොහෝ ක්‍රියා මාර්ග ගත යුතු ව ඇත.

## යෝජනා

සියු මව්වරුන් සමඟ බන්ධනාගාරගත වන ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කළ හැකි ය.

- මව්වරු බන්ධනාගාරගත වන විට ඔවුන්ගේ ළමුන් බන්ධනාගාරගත නොකිරීමට අවශ්‍ය නෛතික විධි විධාන සැලැස් වීම.
- ළමයා බන්ධනාගරගත නොකොට රජයේ රැකවරණය සහිත ආයතනයකට යොමු කිරීම.
- බන්ධනාතාරගත මව දිනකට පැය කිහිපයක් දරුවා සිටින ස්ථානයට පැමිණ මව්කිරි දීම වැනි දරුවාගේ අත්‍යවශ්‍ය කටයුතු ඉටු කළ හැකි වන පරිදි නෛතික විධි විධාන යෙදීම ඇතුළු වෙනත් පහසුකම් රජය සහ රාජ්‍ය නොවන පාර්ශ්ව විසින් සැලැස් වීම.
- එසේ කළ නොහැකි නම් දරුවන් සිටිනා හෝ ගර්භණී සමයේ පසුවන චූදිතයන් හෝ චෝදනා ලැබූවන් නිවාස අඩස්සියේ රඳවා තැබීමට කටයුතු කිරීම.
- බන්ධනාගාරගත කරන්නේ නම් ළමුන්ට වාසය කළ හැකි අවම පහසුකම්වත් තිබෙන සිරමැඳිරිවල ඔවුන් රඳවා තැබීමට කටයුතු කිරීම.
- ළමුන්ට අවශ්‍ය පෝෂ්‍ය ආහාර ලබා දීම සඳහා කටයුතු කිරීම. ඒ සඳහා ප්‍රජා සංවිධානවල සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.

- ළමුන්ට ක්‍රීඩා කිරීමේ පහසුකම් උපරිමයෙන් ලබාදීමට කටයුතු කිරීම.

- එමඟින් ළමුන්ගේ මානසික සංවර්ධනය ඇති කුරවීමට පියවර ගැනීම.

- ළමුන් සමඟ කටයුතු කිරීමේ දී විශේෂ පුහුණු නිලධාරින් යෙදවීම. විශේෂයෙන් මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයයන් උගත් නිලධාරින් පත් කිරීම.

- මව්වරුන්ට ළමුන් විඳින තත්ත්වය පෙන්වා දීම සඳහා කටයුතු කිරීම සහ ඔවුන් ව පුනරුත්ථාපනය කිරීමට විශේෂ ක්‍රියමාර්ග ගැනීම.

- මත්ද්‍රව්‍ය ලබා ගන්නා රැඳවියන් පුනරුත්ථාපනය සඳහා සාර්ථක වැඩ සටහන් හඳුන්වා දීම.

- යළියළි බන්ධනාගාරගත වීම අවම කිරීම අපේක්ෂා කළ යුතු ය. එවිට ළමුන් ද බන්ධනාගාර ගත වීමේ තර්ජනයෙන් මුදවා ගත හැකි ය.

- රාජ්‍ය සහ රාජ්‍ය නොවන එමෙන් ම සාමූහික සහ පෞද්ගලික ක්‍රියාකාරීත්වයන් මගින් මව්වරුන් හෝ ඔවුන්ගේ ළමුන් බන්ධනාගාරගත වීම වැළැක්වීමට අවශ්‍ය නෛතික සමාජ ආර්ථික සහ දේශපාලනික පසුබිම් ගොඩ නැංවීම මෙහි සඳහන් අනෙක් සියලු ම යෝජනාවන්ට සාපේක්ෂ ව වැඩි වටිනාකමක් අත් කර ගන්නා යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කළ හැකි ය.

- මෙම යෝජනාවන් ක්‍රියාත්මක වී බන්ධනාගාරගත වන පිරිස් සහ ඔවුන්ගේ දරුවන්ගේ අයිතීන් සුරක්ෂිත වනු ඇතැයි අපේක්ෂා කරමු.

## පරිශීලිත මූලාශ්‍රයෝ


එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය (1989) මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය; කොළඹ විශ්වවිද්‍යාලය.

කාරියවසම් තිලෝකසුන්දරී (1998) පූර්ව පාසල් අධ්‍යාපනය හැඳින්වීම, කොළඹ, ස්ප්‍රීඩ් ප්‍රින්ටර්ස්.

ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, අංක 50 දරන පනත (1998) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධිත), අංක 22 දරන පනත (1995) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) කොළඹ, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ

දෙපාර්තමේන්තුව.

පල්ලියගුරුගේ රවීන්ද්‍ර චන්ද්‍රසිරි (2009) නියදි සමීක්ෂණය, වැලිකඩ, කොළඹ, මැගසින් කාන්තා බන්ධනාගාරය, අමුද්‍රිත.

බණ්ඩාර, අයි.එම්.සී (2002) 'එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, ආරම්භය, විකාශනය සහ ශ්‍රී ලංකාවේ වත්මන් ක්‍රියාකාරිත්වය' ළමා අයිතිවාසිකම් උල්ලංඝණය වීම (සංස්) දයානන්ද කෝණාර, මාතලේ, සිතුවම් සංවර්ධන අධ්‍යයනය හා පුහුණු සංවිධානය.

රත්නායක රෝහණ (1998) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් ශ්‍රී ලාංකිය අත්දැකීම්, නාවල, විවෘත විශ්වවිද්‍යාලය.

ලියනගේ ශානිකා ශ්‍රියානන්ද (2001) කොටු පවුරේ ගැහැණු, කොළඹ, දයාවංශ ජයකොඩි.